# සුබස් සිතිවිලි



## වි ක ධර්මබන්ධු

"පොලිටික්ස්" යන ඉංගිරිසි වචනය සඳහා අප හදා ගෙන ඇත්තේ "දේශපාලනය" යන සිංහල වචනයයි. ඇත්තේ හැටියට ම එය සකු (සංස්කෘත) වචනයකි. මිනිසුන් නැති බිමක පාලනයක් හෝ පාලකයකු ඇති විය නොහැකි නිසාත් -ජනනායක - ජනපති වැනි වචන මිස - දේශනායක - දේශපති (දේශාදිපති)" වැනි වචන මහරට වැදී නැති නිසාත් එකී වචන දෙක වෙනුවට මා බාවිතා කරන මගේ වචනය වන "ජනපාලනය" මේ ලියවිල්ලේත් බාවිතා කරමි.

මාතර සුශිශ්වර අබේරත්න (එස්.ඒ.) වික්‍රමසිංහ දොස්තර මහතා මගේ ආදරයත් ගෞරවයත් විශ්වාසයත් හිමි කරගත් කෙනෙක් විය (වුහ). එනිසා මම ඔහුගේ ජනපාලන දැක්ම පිලිගත් කෙනෙක් වීමි. පසු ව 1956 ජන පාලන පෙරලියේ දී බන්ඩාරනායක මහතා කෙරෙහි ඇති වු විශ්වාසයත් බලාපොරොත්තුවත් නිසා මම ඔහු ගේ ජනපාලන දැක්ම පිලිගත්තෙමි.

අද මව් බිමින් ඈත් වී සුලුමව් බිමක - දුරු රටක ජීවත් වන මට මව් බිමේ කෙරෙන වැඩ ගැන හෝ කියවෙන කතා ගැන වැඩි දැනුමක් - අවබෝදයක් නැත. මා අද පිය කරන විසේ (විශය) (විෂයය) දෙකක් වේ. එකක් මගේ මව් බස වන සිංහලය ගැන විමසුම් කිරීමය්; ලිවීමය්. දුක් පත් = දුප්පත් වී ඇති විදියට ම සුව පත් = සෝපත් = පෝසත්, පොහොසත් වී ඇතැය් මා සිතුවේ ඒ විමසුම නිසා ය. මා ඒ සොයා ගත් අදහස හරිද වැරදිද යන්න මම නොදනිමි. ගඟ පල = ගංපල = ගම්පල වී ඇතැය් යන මතය මම නොපිලිගනිමි. මා කියන්නේ "ගම්ගොඩ" යන අදහස ම "ගම්පල" යන්නේත් ඇති බවය්.

දික්වැල්ලේ "වැව්රුකන්නල" හැදී ඇත්තේ "වෑ ඉව්රු කන්න ල" යන පද හතර එකතු වීමෙන් බව බොහෝ උගතුන්ගේ මතයය්. බොහෝ වියරන පොත් වලද ආරච්චි ල = වැව්රුකන්න ල හැදී ඇත්තේ එකම වියරන විදියෙන් බව සඳහන්ය. මම එයට එකඟ නොවෙමි. වැව ඉව්රේ කොනේ පිහිටි ගල, වෑ - ඉව්රු - කොන් - ගල ම - වැව්රුකන්නල" වී ඇති බව මගේ අදහසය්. බිත කොන = බිත කන = බිතක්කන වී ඇති නිසාත්, අලියා කොටයක් ඩැහැ ගෙන - ඇද ගෙන යන කොන - අලි කොන = අලිකන" වී ඇති නිසාත් - කොන" ම "කන" වීමේ අරුමයක් නැත. සමහර විට වැව් ඉව්ර කොනේ පිහිටි වල (අවාටය) (දෙ දිය වල මෙන්) යන තේරුම ද එහි ඇති බව පෙනේ. එවිට "වළ" මූර්දජ වෙතත් කොහුවල, දෙහිවල, රන්වල ලියන අපට එහි අමුත්තක් නොදැනේ.

මගේ අනෙක් විසේ (විශය) වන්නේ ගෙවතු වගාවය්. බත් කන නිසා හැමකෙනෙකු ම වී වගා කල යුතු නැති බව සැබවි. අප බත් කන්නේ (ගොඩ / දිය) මස් (එලවලු) මාලු සමගය. එලු - උරු - කුකුලු කොටු තනාගෙන (ගොඩ) මස් ලබා ගැනීම කාටත් කල නොහැක. මින් පොකුනු තනාගෙන (දිය) මස් ලබා ගැනීම ද කාටත් කල නොහැක. හැබැය් කුඩා එලවලු කොටුවක් තනාගෙන තමන්ගේ කෑමට එලවලු වවා ගැනීම සමහර කෙනෙකුට පුලුවන. වගා කිරීමට බිමත්, කාලයත්, වාරුවත් තිබිය දී මිරිස් - තම්පල ගසක් නිවිති - කරවිල වැලක් වවා ගැනීමට නොසිතන නිකමා බත් පතට නය කරුවෙකි; (පොලොවට) රටට බරකි. මගේ ගෙවත්තේ වැවෙන කරිවිලවල රස දන්නා කීප දෙනකුම මෙල්බෝනයේ සිටින බව මතක් වන විට මගේ හිතට සිහිල් නොපටු සුවයක් - සතුටක් දැනේ.

සුබස් සිතිවිල්ලෙන් මගේ අදහස් කියන්නට මා අද තෝරා ගත්තේ පසුගිය (ඔක්තෝබර) සන්නසේ කතුරු (කතෘ) වැකියත්; "බලයෙන් මත් වීම" සහ "යන්ත්‍ර මන්ත්‍ර බෝදි පුජා" යන ලිපි දෙකත්ය; "ඒ ලියවිලි ලියු ඇත්තනුත් මේ ලිපිය කියවති" ය් සිතමි. ඉහත ඉර ඇඳි වැකිය මතක තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

කතුරු (කතෘ) වැකියේත් "බලයෙන් මත්වීම" ලිපියේත් ඇත්තේ සමාන අදහස්ය. "යන්ත්‍ර මන්ත්‍ර පුජා" ලිපියේ ඇත්තේ ඊට වෙනස් - විරුදු අදහස්ය. මේ දෙ -ගොඩින් කවර ගොඩ හරිද, කවර ගොඩ වැරදි ද යන්න විමසීමත් තීරනය කිරීමත් මගේ අදහස - අරමුන නොවේ. නොදන්නා දෙමලෙට ගොස් වරිගය නසා ගැනීමට මට උවමනා නැත. මුදුනාගේ පිට නොකසා සිටීම සිය පන නසා ගැනීමක් බව දන්නා පාතයෝ තැන නොතැන නොබලා මුදුනාගේ පිට කැසීම "ගනං ගන්න එපා" යන්න පමනක් කියමි. " ඕවය් හැටි ඔහොම තමය්.

පෙරෙය්දා ඒ පාටියේ සිටිමින් මේ පාටියට ගැරහු - අපහස් කල එකා ඊයේ මේ පාටියට පැන ඒ පාටියට පහර දුන්නේ ය; ගැරහුවේය. ඒකා ආපසු ඒ පාටියට ගොස් අද යලිත් මේ පාටියට ගරහන්නේය; අපහස් කරන්නේය.



පුදුමය නම් එසේ පිල් මාරු කරන දෙ - දිවියන් (දිව දෙකේ සතා) තොරන් බැඳ පියවිලි අතුරා පිලිගැනීමේ ජඩ නිවට ජනපාලන පිලිවෙතය්.

තම ආගම -සම්මාදිට්ටිය" බවත් අන්‍යාගම් - මිච්චාදිට්ටි" බවත් හැම කෙනාම කියය්. තම දෙවියා -විදුරු දෙවියා" බවත් අනෙක් දෙවියන් - වීදුරු දෙවියන්" බවත් හැම කෙනාම කියය්. පසුගිය මාසයේ අප ඇසු පුවතට අනුව මය්නියක (එෂහෑ) හිර වී සිට එවින් පිරිසක් මිනිසුන් සිය ගනනකගේ උසහයෙන් ගොඩ ගැනුනු පසු ඔවින් කල පලමු කාරිය දෙවියන් පැසසීම ය. ශටලය හොඳින් වැඩ කලේ දෙවියන් නිසාය; දෙවියන්ගේ බැල්ම නිසාය. ශටලය හිර උනානම් එසේ වුයේ ඒ වැඩය කල මිනිසුන්ගේ වරද නිසාය. ඔවින් මය්නියේ හිර කොට - හිර වී සිටින්නට ඉඩ හැර ඉවත බලාගෙන උන්නේ නොහොත් නිදි වැද සිටියේ ඒ දෙවියාම බව සිතන්නට ඔවින්ට කිසිවකු උගන්වා නැත; නොහොත් ඔවින්ට මොලයක් නැත. අපේ රටේ මිමනුත් (මී හරකුනුත්). මිනිසුනුත් වෙහෙස මහන්සි වී අස් වද්දන කුඹුරු නියගෙන් නොහොත් ගංවතුරින් නොහොත් කුරුමීයන්ගෙන් රැක ගත හැකි එකා නිදි වැද සිටි නිසා කුඹුර පාලුවේය. යම්තම් රැකුනු ගොයම් සොච්චමින් ලැබෙන වී පතෙන් -දේවාල පංගුව" ගැනීම සඳහා රතුපාට කරපටියක් එල්ලා ගෙන තිසුලවියක් අතින් ගෙන ගෝනියක් කර තබා ගත් මහල්ලකුත් සමඟ පැමිනෙන (ඇතැම් විට වෙරි මතේ වැනි වැනි) දේව දුතයා කිසි විටක හිස් අතින් ආ පසු නොයය්.

මිනිසුන් එකමුතු කිරීමට - මිනිසුන් රැක බලා ගැනීමට - මිනිසුන් යහ මඟ යැවීමට (මිනිසුන් විසින් ම හදා වදා ගත්) ඇති ආගම මිනිසුන් බේද කොට ඔවින් සතුරන් කිරීමටත් උනුන් මරා ගැනීමටත්, ඔවින් මානසික වහලුන් කිරීමටත් හේතු වෙත් නම් ඒ නඩුව කියන්නේ කාටද? පැද ගෙන යා යුතු ඔරුව ඇද ගෙන පිනීමට පුරුදු පුහුනු කරන ලද මිනිසුන් දකින විට මුනි වත රැකීම ඇඟට ගුනය.

"බලයෙන් මත්වීම" ලියවිල්ලේ ඇති අදහස් හරිද වැර ද යන්න මම නොදනිමි. මගේ හිත යන්නේ අදහස පටලන - අදහස අවිල් කරන කියමන් - වැකිවලටය.

"පුද්ගලයාට වඩා ජනරාල් නමැති සංසිද්දිය වඩා පෘතුල දෙයකි". මෙහි වඩා - වඩා දෙකක් වීම ප්‍රමාද දෝසයක් විය හැකිය. මහාප්‍රාන ලියන ඇත්තන් ලියන "පෘථුල" මෙහි " පෘතුල" වීම වරදකි. එයද ප්‍රමාදයක් විය හැකිය.

-.... නායකයින් පුදුම වී ..... තොරතුරු විමසය් කියාය"
- ...ජන මාද්‍ය තමන් වටා පෙල ගැසෙය් කියාය."

මේ ලේකකයා සිය බසේ වැදගත් වියරන රීතියක්


# MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

**ONSHORE**
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

**OFFSHORE**
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:

**Hirosh Hemantha Gamage MARN 0320696  Peter Russell Loughton  MARN 9789986**

**Tel: 03-94377384**
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

**Tel: 011 5 500 100**
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website

**www.multinational.com.au**

E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696